# මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය

Marxist and Neomarxist Mass
## Media Theory

ටියුඩර් වීරසිංහ

## 1 වන පරිච්ඡේදය

# මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය බිහි වීම සඳහා බලපෑ සාධක

මාක්ස්වාදී සමාජ දර්ශනයේ සමස්ත න්‍යායික සහ සංකල්පීය සන්දර්භයෙන් මාක්ස්වාදී සංහතිකමාධ්‍යවේද න්‍යායය වෙන් කළ නොහැකිය. දර්ශනවාදයේ න්‍යායික සහ සංකල්පීය ව්‍යුහයේ ඓතිහාසික විකාශනයත් සමඟම සංහතිකමාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පයේ හැඩගැස්ම ද එකම වර සිදු වී ඇති බව පෙනේ. එම නිසා සංහතිකමාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පයේ ඓතිහාසික සම්භවයත් එහි සමකාලීන සහ අනාගත සංවර්ධනයත් මාක්ස්වාදී දර්ශනයේ සංවර්ධනය සමඟ සමස්තයක් වශයෙන් සම්බන්ධ කොට සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

## 1.1 ධනවාදයේ වර්ධනය

මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යායයේ සම්භවයට නිශ්චිත කොන්දේසි අත්‍යවශ්‍ය විය. එම න්‍යාය ඕනෑම කාලයක හා ඕනෑම ස්ථානයක බිහි වීමට හැකියාවක් නොවීය. එය ඓතිහාසික ප්‍රපංචයක් වශයෙන් සඳහන් කළ හැකිය. එය සමාජ සංවර්ධනයේ නිශ්චිත සංවර්ධිත මට්ටමක් සමඟ සම්බන්ධ වන්නේය. මානව ඉතිහාසයේ සංවර්ධනයේ නිශ්චිත අවධියක් නියෝජනය වන්නේය. මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යායයේ සම්භවය සහ විකාශනය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධිත හේතු

සාධක රාශියක ප්‍රතිඵලයකි. එම න්‍යායේ බිහි වීම නිශ්චිත හේතු සාධක සංකීර්ණයක ප්‍රතිඵලයකි.

මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යාය බිහි විම සහ හැඩගැසීමට බලපෑ මූලිකතම පූර්ව කොන්දේසිය වන්නේ සමාජය නිශ්චිත සංවර්ධන මට්ටමකට ළඟා වී තිබීමය. සමාජ පන්ති හා පන්ති අරගලය සිදුවීමට අවශ්‍ය තරම් ඉහළ මට්ටමක පැවතීම ඉන් අදහස් වේ. එනම් ධනේශ්වර පන්තිය සහ කම්කරු පන්තිය අතර සමාජ ආර්ථික ප්‍රතිවිරෝධතා තියුණු වීම සහ විප්ලවීය හා කම්කරු ව්‍යාපාරයේ ප්‍රමාණවත් වර්ධනය මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යාය බිහි වීමෙහි ලා අවශ්‍ය වූ පූර්ව කොන්දේසි ලෙස සැලකිය හැකිය. "ප්‍රගතිශීලී මානව චින්තනය ඉදිරිපත් කරන ලද ගැටලුවලට පිළිතුරුදීම තුළ මාක්ස්ගේ මහා පරාක්‍රමය වන්නේය."[1]

19 වන සියවස තුළ යුරෝපා මහද්වීපයේ විශාල රටවල නිෂ්පාදන මාධ්‍යයන්ගේ *(Means of Production)* සහ නිෂ්පාදන බලවේගවල දැවැන්ත සංවර්ධනය ධනවාදයේ ශීඝ්‍ර වර්ධනයට හේතු විය. ආර්ථික ජීවිතය තුළ වර්ධනය වූ ශක්තිය සහ භූමිකාව ධනේශ්වර පන්තියට සිය දේශපාලන අධිපත්‍යයන් තහවුරු කර ගැනීම සඳහා විශාල ශක්‍යතාවක් විවෘත කළේය. එය ධනවාදී සංවර්ධනයට හරස් වූ සියලු බාධක විනාශ කිරීමට සමත් විය. යුරෝපය තුළ නව ධනේශ්වර විප්ලව ඇති වීමට අවශ්‍ය කොන්දේසි බලපෑවේ එංගලන්තයට හා ප්‍රංශයට පමණක් නොව තවමත් ශක්තිමත් වැඩවසම්වාදී පදනමක පසු වූ ජර්මනියට ද මෙය බලපෑවේය. 1830 දී ප්‍රංශයේ ඇති වූ ජූලි විප්ලවය රට තුළ මූල්‍ය ධනේශ්වරයේ ආධිපත්‍ය *(Dominance)* තහවුරු කිරීම සඳහා ඉවහල් විය. මෙහි සාර්ථක ප්‍රතිඵලවල බලපෑමෙන් අවධි වූ සෙසු යුරෝපීය රටවල් ධනේශ්වර ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේය. නිදර්ශනයක් වශයෙන් ජර්මානු ධනේශ්වරය අත්තනෝමතික රාජාණ්ඩුවේ බලය, සීමා කිරීම, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම, ධනේශ්වර පන්තිය රටේ පාලනයට සහභාගී කර ගැනීම ආදී ඉල්ලීම් ඉදිරිපත් කළේය.

සමාජ පන්තියක් *(Social Class)* වශයෙන් ධනපති පන්තියේ හැඩගැසීමත් සමඟම එහි ප්‍රතිවිරුද්ධ සමාජ පන්තිය වන



නිර්ධන පන්තිය ද බිහි වීම සිදු විය. මහාපරිමාණ යාන්ත්‍රික නිෂ්පාදනය කම්කරුවන් විශාල වශයෙන් නිෂ්පාදන ආයතන තුළට සංකේද්‍රණය වීමට තුඩු දුන්නේය. ධනේශ්වර සූරාකෑම උත්සන්න වූ අතර එය ඔවුන් තුළ ඒකාබද්ධ වීමට හා ඔවුන්ගේ පන්ති විඥානය *(Class Consciousness)* වර්ධනය වීමට ආධාරක විය. සමාජීය සහ පන්තිමය ප්‍රතිවිරෝධතා තියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ දේශපාලනික වාතාවරණය උණුසුම් විය. 1825 සිට කාලානුරූපව ඇති වූ ආර්ථික අර්බුද යුරෝපීය රටවල ආර්ථිකයට ප්‍රබල තර්ජනයක් එල්ල කළ අතර කම්කරු පන්තියේ තත්ත්වය ද දැඩි ලෙස අයහපත් අතට යොමු කළේය. මේ අර්බුදාත්මක තත්ත්වයෙන් මිදීම සඳහා කම්කරු පන්තිය විප්ලවීය මාර්ග කෙරෙහි යොමු වන්නට විය. මුලින්ම මීට ප්‍රතිචාර වශයෙන් විශාල කම්කරු පිරිස් යන්ත්‍ර සූත්‍ර වලට එරෙහිව අරගල කළේ ඔවුන්ගේ දරිද්‍රතාවට හේතුව යන්ත්‍ර සූත්‍ර තුළ දුටු නිසාය. 1831 හා 1834 වර්ෂවල ප්‍රංශයේ ලියොන් නගරයේ සිදු වූ කම්කරු අරගලවල මූලික සටන් පාඨය වූයේ "ජීවත් වෙමින් වැඩ කරනවා ද නොඑසේ නම් සටන් කරමින් මිය යන්නේ ද" යන්නයි. මෙය සනිටුහන් කළේ අන්කිසිවක් නොව නිර්ධන පන්තිය දැනටමත් ධනේශ්වර පන්තියට එරෙහිව ඉතිහාසයේ කරලියට අවතීරණය වී ඇති බවයි. 1830 ගණන් වලදී ලෝකයේ සංවර්ධිතම කාර්මික රට වූ එංගලන්තයේ හි ඉතිහාසයේ මුල්ම කම්කරු පන්ති ව්‍යාපාරය වන චාටිස්වාදය *(Chartism)* බිහි විය. මෙයට සහභාගී වූවන්ගේ පොදු අවබෝධය වූයේ කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය යහපත් කළ හැක්කේ දේශපාලන අරගලයක් තුළින් පමණක් බවයි.

ධනවාදයේ සංවර්ධනය පන්ති ප්‍රතිවිරෝධතා උත්සන්න කළේය. එසේම පොදු ජනතාවගේ දුගීභාවය සහ නිර්ධන පන්තියේ පීඩනය ආදී සාධක මගින් එකල සමාජ මතවාදය සකස් විය. මානව සංහතියේ බුද්ධිමය වශයෙන් සක්‍රිය කොටස් මේ තත්ත්වයෙන් අත්මිදීමේ විවිධ මාර්ග, විකල්ප සොයන්නට විය. මෙම පරිස්ථිතිය තුළ මනෝරාජික සමාජවාදයේ *(Utopian Socialism)* විවිධ ස්වරූප මතු වන්නට විය. මෙම මනෝරාජික සමාජවාදී අදහස් යුරෝපයේ විවිධ රටවල එකම කාලයක් තුළ

දී වර්ධනය වීම විශේෂත්වයකි. සෙන් සීමන් ප්‍රංශයේ ද, රොබට් ඕවන් එංගලන්තයේ ද, මේ අදහස් ව්‍යාප්ත කිරීමට සමත් විය. 18 වන සියවස අග භාගයේ සහ 19 වන සියවස මුලදී මේ මනෝරාජික සමාජවාදී චින්තනය තුළ පිළිබිඹු වූයේ අන් කිසිවක් නොව වඩාත් හොඳ, වඩාත් සාධාරණ සමාජ ක්‍රමයක් සඳහා වූ පොදු ජන අභිලාසයයි.

යුරෝපා මහද්වීපයේ සංහතික මාධ්‍යවේදය ඇති වීම සඳහා බලපෑ හේතු අතර විශේෂයෙන්ම වැදගත් වන හේතු සාධක කීපයකි. ආර්ථික වර්ධනය, යුරෝපයේ විශාල රටවල ධනේශ්වරය තහවුරු වීම, විප්ලවීය-ප්‍රජාතන්ත්‍රවාදී ***(Revolutionary Democratism)*** ව්‍යාපාරය සක්‍රීය වීම සහ කම්කරු පන්ති ව්‍යාපාරය ආරම්භ වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඉහත දක්වන ලද හේතු සාධක යුරෝපීය රටවල වාරප්‍රකාශනවල සම්භවයට සහ වර්ධනයට ඉවහල් වූ බව පෙනේ. එම වාරප්‍රකාශන දේශපාලන බලය සඳහා සටන් කරන විවිධ පන්තිවල, කණ්ඩායම්වල වුවමනාවන් නියෝජනය කළේය.

සංහතික මාධ්‍ය වශයෙන් පුවත්පත් හා සඟරා, දාර්ශනික, සමාජීය, දේශපාලනික අදහස් ව්‍යාප්ත කිරීමේ හා තහවුරු කිරීමේ ප්‍රධානතම මාධ්‍යයන් බවට පත් විය. මනෝරාජික සමාජවාදීහු සිය අදහස් පොදු ජනතාව තුළ සහ බුද්ධි ස්තර අතර පැතිරවීමේ අරමුණින් සංහතික මාධ්‍ය වෙතට යොමු වූහ. එංගලන්තය තුළ චාර්ටිස්වාදී ව්‍යාපාරයේ වර්ධනය එහි චාර්ටිස්වාදී සංහතික මාධ්‍ය බිහි වීමට තුඩු දුන්නේය. එසේම 18 වන සියවස අවසානයේ දී ප්‍රංශය ධනේශ්වර විප්ලවය සමයේ සිට පන්ති හා දේශපාලන අරගලය තුළ සංහතික මාධ්‍යවේදය සංහතික මත නිර්මාණය කිරීමේ කාර්යයෙහි ලා අතිවිශාල මෙහෙයක් ඉටු කළේය.

අනාදිමත් කාලයක සිටම ජර්මානු සමාජයේ පැවති ඓතිහාසික විශේෂත්වයන් හේතු කොට ගෙන එහි ප්‍රතිගාමිත්වයේ ආධිපත්‍ය බල පැවැත් විණ. ඒ නිසා සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර බල පැවැත්මට එය හිතකර පරිසරයක් නොවීය. "ජර්මනිය තුළ සැබෑ ප්‍රබල ප්‍රායෝගික දේශපාලන පක්ෂ අතර අරගලයක් නොමැති වූ නිසා එහි සමාජ ව්‍යාපාරය සාහිත්‍ය ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය".[2] මෙහිදී අවධාරණය



කළ යුත්තේ දේශපාලනික සමාජීය ව්‍යාපාරය සාහිත්‍යයික සංහතික මාධ්‍යවේදී ස්වරූපයක් බවට පරිවර්තනය වූ බවය. මේ අනුව ජර්මනිය තුළ පැවති කොන්දේසි මත ලේඛකයින්ගේ, සංහතික මාධ්‍යවේදීන්ගේ සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථී ලේඛනවේදීන්ගේ ***(Publicist)*** ක්‍රියාකාරිත්වයේ වැදගත්කම විවෘත සහ සැඟවුණු ස්වරූපයෙන් සමාජ සංවර්ධනය සඳහා වූ ජනමතය ප්‍රකාශයට පත් විය. විශේෂයෙන්ම මෙහිදී ජර්මානු ධනේශ්වරයේ මතය පිළිබිඹු වූ බව මාක්ස් සහ එංගල්ස් සිය "ජර්මානු දෘෂ්ටිවාදය" නැමති සුප්‍රකට කෘතියෙහි සඳහන් කළහ.

ජර්මනියේ හා යුරෝපයේ ආදී බොහෝ රටවල කම්කරු ව්‍යාපාරය ආරම්භයේ දී කම්කරුවන්ගේ, කම්කරු නායකයින්ගේ අදහස්, මත ප්‍රකාශ කිරීම සඳහාත්, ඔවුන්ගේ වුවමනාවන් ආරක්ෂා කිරීම සඳහාත් මුලින්ම ඉවෙන් මෙන් ද ඉන් අනතුරුව සවිඥානිකව ද වාරප්‍රකාශන කෙරෙහි අවධානය යොමු කළේය. බොහෝ විට යුරෝපයේ විශේෂයෙන් ජර්මනියේ කම්කරු සංවිධාන සහ සංගම් නිර්මාණය වීම සංහතික මාධ්‍ය ප්‍රකාශන බිහි වීමට සමගාමීව සිදු වූ බව පෙනේ. නමුත් ඒ සෑම අවස්ථාවකදීම එය සාර්ථක වූයේ නැත. ඊට හේතුව රට තුළ පැවති දේශපාලන ප්‍රතිගාමිත්වයම පමණක් නොව නිර්ධන පන්ති සංහතික මාධ්‍යවේදයේ අරමුණු හා කර්තව්‍යයන් පිළිබඳව තිබූ අනවබෝධය ද මේ සඳහා සැලකිය යුතු බලපෑමක් කළේය.

සමාජ සංවර්ධනය, විප්ලවීය ව්‍යාපාරයේ නැගීම, ධනේශ්වර සම්බන්ධතාවන්ගේ වර්ධනය හේතු කොටගෙන කම්කරු පන්තියට මඟ පෙන්විය හැකි අලුත් සමාජ න්‍යායක අවශ්‍යතාව මතු කළේය. එම න්‍යාය මුල සිටම ධනේශ්වරයට ප්‍රතිවිරුද්ධ වූද නිර්ධන පන්ති විමුක්තිය අරමුණු කරගන්නා වූද න්‍යායක් ලෙස හැඩගැසෙන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ මාක්ස්ගේ සහ එංගල්ස්ගේ න්‍යායික සහ ව්‍යවහාරික මැදිහත් වීම තුළ එම නව සමාජ න්‍යාය වන මාක්ස්වාදය නිර්මාණය වූ අතර එය නිර්ධන පන්තියේ ලෝකදෘෂ්ටිවාදය ***(Worldoutlook)*** බවට පත් විය.

මේ බිහි වන්නා වූ නිර්ධන පන්තික සංහතික මාධ්‍යවේදයේ න්‍යායික ප්‍රවාදයන් නිර්මාණය කිරීම වඩාත් වැදගත් මෙන්ම සංකීර්ණ කටයුත්තක් ද වූ බව පැහැදිලි වේ.

## 1.2 අපෝහක හා ඓතිහාසික භෞතිකවාදය සහ සංහතික මාධ්‍යවේදය

ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය අනාවරණය කර ගනිමින් භෞතිකවාදී න්‍යාය නිර්මාණය වීමෙන් පසු සංහතික මාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය බිහි වූ බව ප්‍රකාශ කළ හැකිය. කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් මානව සමාජය සංවර්ධනයේ නියමානුකූලතාවන් සොයා ගැනීම නිශ්චිත ලෙසම මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද සංකල්පය බිහි වීමට ඍජු ලෙස තුඩු දුන් බව සඳහන් කළ යුතු වේ. එනම් සංහතික මාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය යනු අන් කිසිවක් නොව සංහතික මාධ්‍යවේද ක්ෂේත්‍රය තුළ ඓතිහාසික භෞතිකවාදයේ *(Historical Materialism)* මූලධර්මවල නිශ්චිතකරණයකි. මාකස්වාදයට පෙර සමාජ ජීවිතය අවබෝධ කරගැනීම සඳහා භෞතිකවාදී මූලධර්ම භාවිත නොකරන ලදී.[3] මාක්ස් හා එංගල්ස් ප්‍රථම වරට භෞතිකවාදී පදනමක් සහිතව සංහතික මාධ්‍යවේදයේ න්‍යාය හා ව්‍යවහාරය වටහා ගැනීම දක්වා ප්‍රවේශ වූහ. අපෝහක භෞතිකවාදයේ *(Dialectical Materialism)* හා ඓතිහාසික භෞතිකවාදයේ මූලධර්ම භාවිත කරමින් මාක්ස් හා එංගල්ස් සංහතික මාධ්‍යවේද ක්ෂේත්‍රයට අයත් ප්‍රපංචයන්ගේ හරය අනාවරණය කිරීමටත්, ඒවායේ පැවැත්මේ හා වර්ධනයේ නිමානුකූලතාවන් අනාවරණය කිරීමටත්, සංහතික මාධ්‍යවේදය සමාජ ජීවිතයෙහි දරන ස්ථානය හා එහි කාර්යභාරය පෙන්වා දීමටත් සමත් වූහ.

"ඉතිහාසය සාදනු ලබන්නේ කෙසේ ද යත්, අවසාන ප්‍රතිඵලය නිතරම පෞද්ගලික අභිමතයන් අතර ගැටුම්වලින් පැන නගියි. මෙම පෞද්ගලික අභිමතයන් එක එක එසේ සකස්වී ඇත්තේ ජීවිතයේ විශේෂ කොන්දේසි රාශියක් මගිනි. මේ අනුව එක සම්ප්‍රයුක්තයක්-ඓතිහාසියීය සිද්ධිය, ජනිත කරන අප්‍රමාණ ඡේදන වන බලවේග, අපරිමිත බල සමාන්තරාශ්‍රයන් මාලාවක් ඇත. මෙයම යළිත්, අවිඥානිකව සහ ඉච්ඡා චේතනාවෙන් තොරව සමස්තයක් වශයෙන් ක්‍රියා කරන බලයක ඵලයක් වශයෙන් දැකිය හැකිය".[4] මේ ඉහත ගෙනහැර දක්වන ලද ආස්ථානය



ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී සංකල්පය අනාවරණය වන අතර එය මාක්ස්වාදයේ එක් සාමස්තික කේන්ද්‍රීය සංකල්පයක් වශයෙන් දැක්විය හැකිය. මාක්ස්වාදය මගින් හැඩගස්වන ලද මෙම ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය මාක්ස්වාදයේ පදනම වූවා පමණක් නොව එය සමස්ත සමාජ සහ මානව විද්‍යා ක්ෂේත්‍රයට ආවශ්‍යයික විද්‍යාත්මක සහ වාස්තවික පදනමක් ද සැපයුවේය.

ස්වභාවධර්මයෙහි ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරීත්වයන් හා අන්තර් ක්‍රියාකාරකම්වල මූලිකම ලක්ෂණය වන්නේ වාස්තවික සහ අවිඥානික ස්වභාවයයි. ස්වභාවධර්මය තුළ සවිඥානික සහ සැලසුම් සහගත තත්ත්වයන් දක්නට නොවේ. ඒ නිසා ස්වභාවධර්මයෙහි ක්‍රියාත්මක නියාම මුළුමනින්ම ආත්මීය සහ සවිඥානික සාධකයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වේ. නමුත් මිනිස් සමාජය තුළ ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය ක්‍රියාත්මක වීම සිදු වන්නේ ආත්මීය සහ සවිඥානික සාධකවල බලපෑම තුළින් හට ගන්නා විවිධ වූ සංස්කරණයන්, විකරණයන් සහිතවය. එනම් ස්වභාවධර්මය තුළ මෙන්ම සමස්ත ද්‍රව්‍යයෙහි ප්‍රගමනයේ සමාජයීය ස්වරූපය තුළ එම නියම සුවිශේෂීය ස්වරූපයකින් ක්‍රියාත්මක වේ. "සමාජ ඉතිහාසයේ නළුවන් සියල්ලම විඥානයකින් සමන්විත වේ. ඔවුන් විචාරයකින් හෝ අනුරාගයකින් ක්‍රියා කරන, නිශ්චිත ඉලක්ක සඳහා වැඩ කරන මිනිසුන් වේ. මෙහි සවිඥානික පරමාර්ථයකින් තොරව, අපේක්ෂිත අරමුණකින් තොරව කිසිවක් සිදු නොවේ. එහෙත් මෙම වෙනස, ඓතිහාසීය විමර්ශනයට කෙතරම් වැදගත් වූ වද, ඊට ඉතිහාසීය ගමන් මඟ අභ්‍යන්තර පොදු නියමයන් විසින් පාලනය වනු ලැබීම වෙනස් කිරීමට නොපුළුවන. සැබැවින් මෙහි සියලු පුද්ගලයන්ගේ සවිඥානික ලෙස අපේක්ෂිත අරමුණු තිබුණ ද, සමස්තයක් වශයෙන් ගත් කල මතුපිටින් පැහැදිලිවම පෙනෙන අයුරින් අහඹු සිදුවීම් රජයයි.[5] ඉතිහාසය තුළ ක්‍රියාත්මක වන මෙම අහඹු සිදුවීම් යනු ඓතිහාසික අනිවාර්යයේ ප්‍රකටීකරණය (manifestation) බව අප අවබෝධකර ගත යුතුය. අහඹු සිදුවීම් ද යම් යම් නිශ්චිත නියමයන්ගේ ක්‍රියාත්මක වීමකි. "එහෙත් මතුපිටින් අහඹු සිදුවීම් රජයන තැන, ඇත්ත වශයෙන් එය නිතරම පාලනය වනු ලබන්නේ අභ්‍යන්තර, සැඟවුන නියමයන්වලිනි.

මෙහිදී කාර්ය නම්, එම නියමයන් සොයා ගැනීමයි".[6] මේ අනුව විද්‍යාවේ අරමුණු එම සැඟවුන නියමන් සොයා ගැනීම බව පැහැදිලිය. සංහතික මාධ්‍යවේදය සංහතික මාධ්‍ය අධ්‍යයන ඇතුළු සමස්ත මානව සහ සමාජයීය විද්‍යාවන්ගේ ද මුඛ්‍ය අරමුණ වන්නේ අදාළ ක්ෂේත්‍රවල නියමයන් අනාවරණය කර ගැනීමත් ඒවා අදාළ විෂයන්ගේ සහ සමාජ ප්‍රගතිය සඳහා භාවිත කිරීමත්ය.

ඇත්ත වශයෙන්ම ඓතිහාසික භෞතිකවාදය යනු අපෝහක භෞතිකවාදයේ ක්‍රමවේදාත්මක මූලධර්ම සමාජ ජීවිතය ක්ෂේත්‍රයට අදාළව නිශ්චිතකරණය කිරීමකි. එසේම මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යාය *(Marxist Media Theory)* යනු ඓතිහාසික භෞතිකවාදී මූලධර්ම සංහතික මාධ්‍යවේද ක්ෂේත්‍රයට අදාළව නිශ්චිතකරණය කිරීමකි. ඓතිහාසික භෞතිකවාදය යනු සමාජ ජීවිතය පැහැදිලි කිරීම පිළිබඳ පොදු දාර්ශනික පදනමක් වන අතරම එය මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යායේ දාර්ශනික පදනම ද වන්නේය.

සමාජ විඥානයට *(Social Consciousness)* සාපේක්ෂව සමාජ සත්තාවේ *(Social Being)* ප්‍රාථමික බවත්, ආර්ථික පදනම හෙවත් අධෝව්‍යුහය *(Basis)* සහ සමාජ උපරිව්‍යුහය *(Superstructure)* අතර පවතින්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධයත් මාක්ස් විසින් 1859 දී දේශපාලන ආර්ථික විද්‍යාවට විවේචනයක් නැමති කෘතියේ පෙරවදනෙහි සම්භාව්‍ය ස්වරූපයෙන් සූත්‍රගත කළේය. සංහතික මාධ්‍යවේදයේ කාර්යභාරය, භූමිකාවල හා වැදගත්කම සමාජයේ උපරිව්‍යුහයේ සංරචකයක් වශයෙන් අවබෝධ කර ගැනීම සඳහා මඟ පෑදුවේය.

සමාජය එහි සංරචකයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවන්ගේ සහ අන්‍යෝන්‍යක්‍රියාකාරිත්වයේ මෙන්ම, සමාජය වෙනස් වීම හා වර්ධනය වීම එහි අභ්‍යන්තර ප්‍රභවයන්ගේ ක්‍රියාකාරිත්වය මගින් සිදු වන බව ඓතිහාසික භෞතිකවාදය මගින් පෙන්වා දෙයි. මේ ආකාරයට සංහතික මාධ්‍යවේදයේ පැවැත්මේ හා වර්ධනයේ අභ්‍යන්තර ප්‍රභවයන් ඓතිහාසික භෞතිකවාදය මගින් පැහැදිලි කරනු ලැබේ. "වංකගිරිකයක් සහ ව්‍යාකූලත්වයක් සේ පෙනී ගිය සමාජ ජීවිතයේ නියමානුකූලතාවන් වටහා ගැනීම සඳහා



පන්ති අරගල න්‍යාය ඉවහල් වූ බව"[7] ලෙනින් පෙන්වා දුන්නේය. මාක්ස්වාදය විසින් සමාජය කිය වීම පිළිබඳව ඉදිරිපත් කරන ලද මෙම න්‍යායික මඟ පෙන්වීම තුළින් සංහතික මාධ්‍යවේදයේ වර්ධනයේ විශේෂතා විශ්ලේෂණය කිරීම සඳහා ද අදාළ කර ගත හැකිය. මාක්ස්වාදය පන්ති අරගල න්‍යාය සමාජයේ දෘෂ්ටිවාදීමය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය හා හරය තේරුම් ගැනීම සඳහා යොදමින් එය සමාජ ජීවිතයට සිදු කරනු ලබන බලපෑම විද්‍යානුකූලව පැහැදිලි කරන ලදී.

මේ අනුව ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය හා ඓතිහාසික භෞතිකවාදය නිර්මාණය කිරීම මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යාය බිහි වීම සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වූ බව අවධාරණය කළ යුතුය.

මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යාය හැඩගැස්වීමෙහි ලා තවත් ඉතා වැදගත් පූර්ව කොන්දේසියක් වූයේ මාක්ස්ගේ හා එංගල්ස්ගේ සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වය සහ විප්ලවීය ව්‍යවහාරයයි.

## 1.3 සමාජ-දේශපාලනික ක්‍රියාකාරීත්වය සහ න්‍යායේ සහ ව්‍යවහාරයේ සුසංයෝගය

මාක්ස්වාදයට පෙර වූ සමාජය පිළිබඳ විවිධ න්‍යායික-සංකල්පීය හැදෑරීම්වල මූලික ලක්ෂණයක් වූයේ න්‍යාය *(Theory)* හා ව්‍යවහාරය අතර වූ නොගැළපීමයි. නමුත් මාක්ස්වාදී සංකල්පය තුළ න්‍යාය හා ව්‍යවහාරය අතර ඒකීයත්වයක් ප්‍රදර්ශනය විය. සමාජය විප්ලවීය අකාරයට වෙනස් කිරීමේ න්‍යායික භාවිතයක් ලෙස මාක්ස්වාදය වේගයෙන් ව්‍යාප්ත වන්නට විය. සියලු න්‍යායික හා දාර්ශනික ගොඩනැගීම්වල සත්‍යවාදීභාවයේ ඒකායන නිර්ණායකය හා පදනම ව්‍යවහාරය බව අවධාරණය කරමින් මාක්ස්වාදය සමාජ විද්‍යා ක්ෂේත්‍රයට නව ප්‍රවේශයක් දුන්නේය. සමාජ විද්‍යාවන්ට විද්‍යාත්මක වූද වාස්තවික වූද පදනමක් සකස් කිරීමෙහි ලා ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය අතිශයින්ම මූලාධාර විය. එහි අර්ථය

නම් ස්වභාවික විද්‍යාවන් සේම සමාජීය විද්‍යාවන්ට ද ඊටම ආවේණික වූ විෂයමූලික නියමයන් පවතින බවත් එම නියමයන් විඥානයෙන්, චින්තනයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන බවත්, මිනිසා සිය අධ්‍යයනයන් තුළින් එම නියමයන් අනාවරණය කොටගෙන සමාජ ප්‍රගතිය සඳහා එම නියමයන් භාවිත කිරීමේ ශක්‍යතාව මිනිසා සතු අද්විතීය ගුණයක් බවත්ය.

මාක්ස්වාදයේ පුරෝගාමීහු සමාජ ජීවිතයේ භාවිතයන් සමඟ ඉතාම සමීපව කටයුතු කළ බැවින් ඔවුන් පරම පවිත්‍ර න්‍යායචාරීහු නොවූහ. ඔවුහු න්‍යාය තුළ සමාජ භාවිතය සූත්‍රගත නොකළ අතර සමාජ භාවිතය තුළ න්‍යාය සූත්‍රගත කළහ. මෙම ස්ථාවරය ඔවුන්ට සමාජය පැවැත්මේ, ක්‍රියාත්මක වීමේ, නියාමයන් අනාවරණය කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කළේය.

සමාජ අරගලය තුළ මාක්ස් න්‍යායේ හා ව්‍යවහාරයේ ඒකීයත්වය නිර්ණය කළේය. පවතින්නා වූ සැබෑ කොන්දේසි වෙනස් කිරීම සඳහා ක්‍රියාකාරී, ප්‍රායෝගික හා විප්ලවීය න්‍යාය හා ව්‍යවහාරය විප්ලවීය අරගලයක් මාක්ස්ට අවශ්‍ය විය. භාවිතය තුළ ඒකාත්මික කිරීමේ අභිලාෂයන් මාක්ස් හා ඔහුගේ සගයින් විසින් ආරම්භ කරන ලද සඟරාවල මූලික ප්‍රතිපත්තිය පවා සකස් කළේය. මෙයටත් වඩා ඉදිරියට යමින් මාක්ස් සමස්ත ජර්මානු විප්ලවීය-ප්‍රජාතාන්ත්‍රික මාධ්‍යයේ මුළු ක්‍රියාකාරී වැඩ පිළිවෙළ ද නිර්ණය කළේය. මේ කාලය තුළ සිය ප්‍රායෝගික විප්ලවීය හා දේශපාලන ක්‍රියාකාරිත්වය මාක්ස් පිළිබිඹු කළේ සංහතික මාධ්‍ය සහ සමාජ-දේශපාලන ප්‍රකාශනර්පිලේඛනවේදී ක්‍රියාකාරී ස්වරූපය මගිනි. එම නිසා ජර්මානු සමාජය නවීකරණය කිරීම, හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගෙන ගිය දේශපාලන අරගලය තුළ විප්ලවීය-ප්‍රජාතාන්ත්‍රීය හා කම්කරු සංහතික මාධ්‍ය අවියක් කර ගැනීමට මාක්ස් ප්‍රයත්න දැරීය.

1845 දී පළ කරන ලද "ෆියෙර්බාහ් ගැන තීසිය" "මහා ලෝකදෘෂ්ටියක උපත සනිටුහන් කළ ප්‍රථම ලියවිල්ල"[8] වූ බව එංගල්ස් ප්‍රකාශ කළේය." "දාර්ශනිකයෝ විවිධාකාර ලෙස ලෝකය අතර්ථකථනය කළහ. නමුත් කළ යුත්තේ එය වෙනස් කිරීමයි"[9] යන ප්‍රකාශනය සමාජ ජීවිතය තුළ විප්ලවීය භාවිතයේ



තීරණාත්මක භූමිකාව පිළිබිඹු කළේය. මෙය මාක්ස් විසින් ඉදිරිපත් කළ නව ලෝකදෘෂ්ටිවාදයේ මූලික මූලධර්මය වන්නේය. එම මූලධර්මයන් සමඟම නව සංහතික මාධ්‍යවේද භාවිතයක දාර්ශනික දැක්ම සනිටුහන් කළ බව ප්‍රකාශ කළ යුතුය. මේ අනුව මෙය මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද න්‍යායයේ දෘෂ්ටිවාදීමය පදනම් නිර්මාණය කළේය.

සමාජ වර්ධනයත් සමඟම මාක්ස්වාදය ද වර්ධනය විය. මාක්ස්වාදය නිරන්තරවම සමාජීය සංවර්ධනයේ අත්දැකීම් පදනම් කොටගෙන සිය සංකල්පීය ව්‍යුහය හැඩ ගස්වා ගත්තේය. මෙය මාක්ස්වාදීය සංහතික මාධ්‍යවේදී න්‍යායේ වර්ධනයට ද එකසේම අදාළ වන්නේය. විවිධ පක්ෂවල, පන්තිවල, සමාජ බලවේගවල අරගලයන් සමඟම මාක්ස්වාදීය සංහතික මාධ්‍යවේදී න්‍යාය ක්‍රමානුකූලව හා ඓතිහාසිකව වර්ධනය විය.

සංහතික මාධ්‍යවේදය සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වයේ සංයුක්ත ස්වරූපයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර එය ව්‍යවහාරික විප්ලවීය ක්‍රියාකාරිත්වයෙන් වෙන් කළ නොහැකිය. මාක්ස් හා එංගල්ස් ප්‍රායෝගිකව ජනතාව සමඟ සමාජ විප්ලවීය ක්‍රියාවලිය තුළ ක්‍රියාකරමින් සංහතික මාධ්‍යවේදය පිළිබඳව සිය අදහස් වර්ධනය කරගත් බව අවධාරණය කළ යුතුය. මාක්ස් හා එංගල්ස්ගේ විද්‍යාත්මක-න්‍යායික කටයුතුවල ඓන්ද්‍රිය ඉදිරි වර්ධනයක් ලෙස සංහතික මාධ්‍යවේදීය ක්‍රියාකාරිත්වය ඔවුහු දුටහ. අප විද්‍යාඥයින්ගේ අලුත් විද්‍යාත්මක අදහස් ලොකු පොත්වල ලිවීමට පමණක් සීමා වීම කිසිසේත්ම බලාපොරොත්තු නොවන බව එංගල්ස් ප්‍රකාශ කරමින් මාක්ස්වාදය විප්ලවී භාවිතය සමඟ ඇති සම්බන්ධතාව අවධාරණය කළේය. "අප දෙදෙනා දැනටමත් ඉතා ගැඹුරු අන්දමට දේශපාලන ව්‍යාපාරයට අවතීර්ණව කටයුතු කරන්නේය" එසේම බටහිර ජර්මානු බුද්ධිමතුන් කිහිපදෙනෙක් ද අපේ අනුගාමිකයන් වශයෙන් අපට සම්බන්ධ වී කටයුතු කරන අතර විශේෂයෙන් සංවිධානාත්මක කම්කරුවන් සමඟ ප්‍රමාණවත් සම්බන්ධතා අපට තිබේ"[10] මාක්ස් හා එංගල්ස් ඔවුන්ගේ අදහස් කම්කරු පන්තිය තුළට ගෙන ගොස් කම්කරුවන් තුළ විශ්වසනීයත්වය ගොඩනැගිය හැකි වඩාත්ම වැදගත් මාධ්‍ය ලෙස සලකන ලද්දේ සංහතික

මාධ්‍යවේදයයි (වාරප්‍රකාශනවේදයයි). විශේෂයෙන්ම මාක්ස් හා එංගල්ස් *(Deutsche Brusseler Zeitung)* මගින් එංගල්ස් චාටිස් ව්‍යාපාරයේ මාධ්‍ය සමඟ මෙන්ම ප්‍රංශ සමූහාණ්ඩුවාදී පුවත්පත් සමඟ සිය නිර්මාණාත්මක දායකත්වය දෙමින් සම්බන්ධතා පවත්වා ගෙන ගියහ. "විද්‍යාත්මක සමාජවාදී අදහස් ව්‍යාප්ත කිරීම සඳහා පුවත්පත් අතිශයින්ම වැදගත් වන අතර ඒ සඳහා අප රැඩිකල් හා කම්කරු පන්ති සංවිධාන සමඟ මෙන්ම මාධ්‍ය ආයතන සමඟ පවත්වා ගෙන ගිය සම්බන්ධතාව ඊට වඩා හොඳ විය නොහැකිය".[11]

වී.අයි. ලෙනින් සිය පර්යේෂණාත්මක කටයුතුවල දී රුසියාවේ සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු පිළිබඳව පමණක් නොව රුසියානු කම්කරු පන්ති සංහතික මාධ්‍යවේදය පිළිබඳව සිය ගැඹුරු අවධානය යොමු කළේය. රුසියාවේ "කම්කරු පන්ති සංහතික මාධ්‍යවේදය ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ව්‍යාපාරය සමඟ වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධ බව"[12] ලෙනින් පෙන්වා දුන්නේය. රුසියානු සංහතික මාධ්‍යවේදය පිළිබඳ ලෙනින්ගේ ස්ථාවරය රුසියාවට පමණක් සීමා නොවන අතර එය වෙනත් රටවලට ද අදාළ වේ. ඕනෑම රටක කම්කරු පන්ති සංහතික මාධ්‍යවේදය වර්ධනයත් එහි න්‍යායික හා සංකල්පීය ව්‍යුහය හැඩගැසීමත් ප්‍රජාතන්ත්‍රවාදී හා කම්කරු පන්ති ව්‍යාපාරය සමඟ අවියෝජනීය ලෙස සම්බන්ධව පවතී. විශේෂයෙන්ම මාක්ස්වාදී සංහතිකමාධ්‍යවේදයේ න්‍යායික හා සංකල්පීය ව්‍යුහය ලෝක කම්කරු පන්ති සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙන් තොරව බිහි වීමට නොහැකි තරමට එය එම සමාජ ව්‍යාපාර සමඟ සම්බන්ධය ය. මාක්ස්වාදීය සංහතිකමාධ්‍යවේදී න්‍යායික හා සංකල්පීය ව්‍යුහය විප්ලවීය භාවිතයේ විශේෂතා හා ගති ලක්ෂණ සමඟ මෙන්ම මාක්ස්වාදී පුරෝගාමීන්ගේ දැවැන්ත න්‍යයික හා ව්‍යවහාරික පරිශ්‍රමයන් සමඟ සම්බන්ධ බව සැලකිය යුතුය.

ඓතිහාසික ක්‍රියාවලිය තුළ බොහෝ වාස්තවික නියාමයන් මතු වන්නේ පුද්ගල ස්වරූප මඟින් බව පෙනේ. අදාළ විෂයමූලික ක්‍රියාවලින් පුද්ගලයන්, කණ්ඩායම් හා සමාජ ව්‍යාපාර මඟින් සාක්ෂාත්කරණය වන්නේය. මාක්ස්වාදී සංහතික මාධ්‍යවේද



සංකල්පයේ ඓතිහාසික හා එහි න්‍යායාත්මක හැඩගැස්ම කෙරෙහි කාල් මාක්ස්ගේ සහ ෆ්‍රේඩ්රික් එංගල්ස්ගේ පෞරුෂීය සහ පුද්ගලික අත්දැකීම් අතිශය වැදගත් වී ඇති බව පැහැදිලි වන්නේය. විශේෂයෙන්ම ඔවුන්ගේ පුද්ගලික සංහතික මාධ්‍යවේදනාත්මක සහ සමාජ-දේශපාලන ප්‍රකාශනර්ථිලේඛනවේදී අත්දැකීම් මෙහි දී විශාල වැදගත් කමක් දරන්නේය.

සංහතික මාධ්‍යවේදීය ක්‍රියාකාරිත්වය හුදු සංහතික මාධ්‍යවේදී ක්‍රියාකාරිත්ව පරාසයක් තුළ ඔවුහු ස්ථාන ගත නොකළහ. සැමවිටම ඔවුන් ඔවුන්ගේ සංහතික මාධ්‍යවේදාත්මක සහ සමාජීය ප්‍රකාශන ක්‍රියාවලිය විප්ලවීය-ව්‍යවහාරික පක්ෂමය හා දේශපාලන ක්‍රියාකාරකම්වල සැලකිය යුතු කොටසක් වශයෙන් සැලකිල්ලට ගත්තේය. මාක්ස් හා එංගල්ස් එම කටයුතු ඔවුන්ගේ විද්‍යාත්මක න්‍යායික දැනුමින් වෙන් නොකළ අතර න්‍යාය හා ව්‍යවහාරය සංයුක්ත කරන සංකීර්ණයක් ලෙස දුටුවේය. සමහර විට වඩාත් වැදගත් න්‍යායික අදහස් මුලින්ම සංහතික මාධ්‍යවේදාත්මක නිර්මාණ තුළ ප්‍රකාශිතව ඉන් පසුව ඔවුන්ගේ මූලික න්‍යායාත්මක කෘතිවලට ඇතුළත් කරන ලදී. මෙය න්‍යාය හා භාවිතය සංහතික මාධ්‍යවේදාත්මක සන්දර්භය තුළ ක්‍රියාත්මක වීමේ සංකීර්ණ ස්වරූපය කියා පාන්නකි. සංහතික මාධ්‍ය සඳහා යම්කිසි නිර්මණයකට සූදානම් වීම තුළම ඊට වඩා ගැඹුරු න්‍යායික සූත්‍රගත කිරීමකට උත්තේජනයක් ද විය හැකිය. මාක්ස් සංකීර්ණ ආර්ථික ප්‍රශ්න කෙරෙහි සිය අවධානය යොමු කිරීමට තුඩු දී ඇත්තේ ද ජර්මනියේ රයින්ස්කී ප්‍රදේශයේ හොර වන කැපීම සහ නිදහස් වෙළඳාම පිළිබඳව රයින්ස්කි පුවත්පත *(Rheinische Zeitung)* සමඟ සිදු වූ සංවාදයක ප්‍රතිඵලයක් ලෙසිනි.

මෙයට වෙනස් අවස්ථාවක දී න්‍යායාත්මක අදහස් සංහතික මාධ්‍යවේදාත්මක ස්වරූපයට සරිලන අකාරයට ඉදිරිපත් කිරීමට ද මාක්ස්ගේ හා එංගල්ස්ගේ ක්‍රියකාරකම් තුළ නිරීක්ෂණය කළ හැකිය. නිදර්ශනයක් වශයෙන් මාක්ස් හා එංගල්ස්ගේ ඇමරිකා එක්සත් ජනපදයේ *(New-York Daily Tribune)* පුවත්පතට යවන ලිපි මේ වර්ගයට අයත් වේ. එම ලිපි මූලික වශයෙන් සමකාලීන දේශපාලනික හා ආර්ථික ප්‍රශ්න පිළිබඳව සම්පාදනය වූ ඒවා විය. මාක්ස් හා එංගල්ස් සිය සංහතික මාධ්‍යවේදාත්මක හා සමාජ

දේශපාලන ප්‍රකාශනර්ථිලේඛනවේදී ක්‍රියාකාරකම් සලකන ලද්දේ ඔවුන්ගේ න්‍යායික, විප්ලවීය ව්‍යවහාරික, පාක්ෂික ක්‍රියාකාරිත්වයේ අත්‍යාවශ්‍ය ඓන්ද්‍රිය ස්වරූපයක් වශයෙනි. විශේෂයෙන්ම "කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය" සම්පාදනය කිරීමේ දී මාක්ස් හා එංගල්ස් සමස්ත නූතන ඉතිහාසයේ පොදු ලක්ෂණ සැලකිල්ලට ගත්තේ ඉහත න්‍යායික සංකල්පීය ක්‍රමවේදයට ***(Methodology)*** අනුවය. සංහතික මාධ්‍යවේදීය හා සමාජ දේශපාලන ප්‍රකාශනර්ථිලේඛනවේදීය සඳහා මාක්ස්වාදයේ ඇති වැදගත්කම අවධාරණය කරමින් නව රින්ස්කි පුවත්පත *(Neue Rheinische Zeitung)* ට කාලීන දේශපාලන සිද්ධි පිළිබඳ ලිපි පෙළක්ම මාක්ස් හා එංගල්ස් සැපයීය. සමාජීය හා දේශපාලනික ගැටලු පිළිබඳව සමාජවාදී අදහස් ජනතාව අතරට ගෙන යෑම සඳහා මාක්ස් නිරතුරුවම නවරින්ස්කි පුවත්පත ප්‍රයෝජනයට ගත්තේය. මෙම පුවත්පත පාක්ෂික පුවත්පතක් විය.

මාක්ස්ගේ මුළු ජීවිත කාලයම බොහෝ පුවත්පත් සඟරා හා වාරප්‍රකාශන සමඟ සම්බන්ධව තිබූ අතර එංගල්ස් ඊටත් වඩා සංහතික මාධ්‍ය සමඟ සම්බන්ධව කටයුතු කළේය. සංහතික මාධ්‍යවේදය හා සංහතික මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මාක්ස්ට අති විශාල අත්දැකීම් සමුදායක් තිබුණේය. ඔහු පුවත්පත් සඟරා හා වාරප්‍රකාශන සංස්කාරකවරයෙකු වශයෙන් ද පුවත්පත් හා සඟරා සංවිධායකයෙකු වශයෙන් ද ග්‍රාහකත්වය සමඟ සබඳතා ගොඩනගා ගන්නෙකු වශයෙන් ද ආදී සමස්ත සංහතික මාධ්‍ය කර්මාන්තය පිළිබඳ අතිවිශාල අත්දැකීම් සම්භාරයකින් පරිපූර්ණව සිටියේය.

## 1 වන පරිච්ඡේදය

## පාදක සටහන්

1. වී.අයි. ලෙනින් එකතුකළ සම්පූර්ණ කෘති, වෙළුම 23, පිටුව 40.
2. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති, වෙළුම 3, පිටුව 450.
3. වී.අයි. ලෙනින් සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 18, පිටුව 350-351.
4. එංගල්ස් ෆ්‍රෙඩ්රික්, එංගල්ස් විසින් ජේ. බ්ලොක් වෙත (1890 සැප්තැම්බර් 21) // මාක්ස්, එංගල්ස් ආගම ගැන, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්, 1985 පිටුව 354.
5. ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ලුද්විග් පොයර්බාහ් සහ සම්භාව්‍ය ජර්මන් දර්ශනවාදයේ අවසානය//කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ආගම ගැන, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්, 1985 පිටුව 326.
6. ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ලුද්විග් පොයර්බාහ් සහ සම්භාව්‍ය ජර්මන් දර්ශනවාදයේ අවසානය//කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ආගම ගැන, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්, 1985 පිටුව 327.
7. වී.අයි. ලෙනින් සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 26, පිටුව 58.
8. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 21, පිටුව 371.
9. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 3, පිටුව 4.
10. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 21, පිටුව 221.
11. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 21, පිටුව 221.
12. වී.අයි. ලෙනින් සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 25, පිටුව 93.